# ජාතික අධ්‍යාපන ආයතනයේ
# මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ
# ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ජාතික අධ්‍යාපන ආයතනයේ මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පිළිගත් ආපනශාලා/ රෙස්ටුරන්ට්/ හෝටල් හිමියන් වෙතින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකාවක් සඳහා ආපසු නොගෙවන රු.500.00 ක තැන්පතුවක් අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 607628 (BA කේත අංකය යටතේ - කේත අංකය පිළිබඳ තොරතුරු ටෙන්ඩර් ඒකකයෙන් ලබා ගත යුතුය) ලංකා බැංකුව - මහරගම වෙත ගෙවා ලබා ගත් ලදුපත ප්‍රසම්පාදන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලියවිල්ල සහ සියළු විස්තර ලබා ගත හැක.

ටෙන්ඩර් පත් නිකුත් කිරීම 2023.05.29 දින ප.ව. 3.00 න් අවසන් වේ.

සම්පූර්ණ කරන ලද ලංසු ලියවිල්ල මුද්‍රා තබා 2023.05.30 දින ප.ව. 2.00 ට ප්‍රථම ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,ජාතික අධ්‍යාපන ආයතනය, හයිලෙවල් පාර, මහරගම යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් එවීම හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.ලංසු ලියවිල්ල බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙරවලේ "NIE/LP/2023/21 - මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා සේවා සපයන්නෙකු තෝරා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

2023.05.30 දින ප.ව. 2.00 ට ලංසු ලියවිලි විවෘත කරනු ලැබේ.

මෙම ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ අවසන් තීරණය ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය වේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා 011-7601799 / 011-7601797 අමතන්න.

අධ්‍යක්ෂ ජනරාල්<br>
ජාතික අධ්‍යාපන ආයතනය<br>
මහරගම<br>
2023.05.09